සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

විභාග අංකය: ....

ව්‍යාපාර අධ්‍යයනය - I

කාලය පැය 02 යි

උපදෙස්:-

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති තිත් ඉර මත පැහැදිලි ව සටහන් කරන්න.

ප්‍රශ්න අංකය	ලකුණු
01 - 30	
31 - 50	
එකතුව	

(01) පහත සඳහන් වන්නේ වුවමනා පිළිබඳව ශිෂ්‍යයින් හතර දෙනකුගේ අදහස්ය.

A වුවමනා යනු අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූපය

B වුවමනා යනු කැමැත්ත ය.

C වුවමනා යනු අවශ්‍යතා ඉටුකර ගැනීමට කිසියම් නිශ්චිත නිෂ්පාදිතයකට යොමු වීමය.

D වුවමනා යනු කාලානුරූපව වෙනස් වන රුචිකත්වයයි.

මෙම ප්‍රකාශ අතරින් වුවමනා පිළිබඳව ප්‍රතික්ෂේප කළ නොහැකි අදහස් වන්නේ,

(1) A හා D පමණි. (2) A, B, C පමණි.

(3) A, B, C, D යන සියළු ප්‍රකාශයන්ය. (4) A, C පමණි.

(5) A, B පමණි. (........)

(02) භාණ්ඩ හා සේවාවල ස්වභාවය අනුව ශුද්ධ භාණ්ඩ, ශුද්ධ සේවා හා දෙමුහුන් නිෂ්පාදිත නිවැරදිව වර්ගීකරණය කර ඇති පිළිතුර තෝරන්න.

	ශුද්ධ භාණ්ඩ	දෙමුහුන් නිෂ්පාදිත	ශුද්ධ සේවා
(1)	රක්ෂණය	ආපන ශාලා ආහාර	සබන් කැටයක්
(2)	උපකාරක පන්තියක්	මෝටර් රථයක්	කොණ්ඩේ කැපීමේ සේවාව
(3)	පාන් ගෙඩිය	ආපන ශාලා	නීති උපදෙස්
(4)	බැංකු සේවාව	රූපවාහිනී යන්ත්‍ර	ඇඳුම් මැසීම
(5)	සීනි පැකට්ටුවක්	නීති උපදෙස්	මෘදුකාංග සැපයීම.

(........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(03) චක්‍රීය ආර්ථිකයක් යනු (Circular Economy)

(1) ව්‍යාපාරයක් නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය විදේශ රටවලින් ආනයනය නොකර දේශීය සම්පත් පමණක් භාවිත කරමින් නිෂ්පාදන චක්‍රය පවත්වාගෙන යාමයි.

(2) පාරිභෝගිකයා විසින් භාණ්ඩයක් මිලදී ගත් පසු එය භාවිත කර විනාශ කර දැමීම වෙනුවට ප්‍රතිචක්‍රීකරන මධ්‍යස්ථානයකට භාරදීමට කටයුතු කිරීමයි.

(3) නිෂ්පාදනය සැලසුම් කිරීමේ සිට පරිභෝජනය දක්වා සෑම අදියරයකදීම සම්පත් නාස්ති අවම කරමින් ද්‍රව්‍ය හා බලශක්තිය උපරිම කාලයක් ආර්ථිකය තුළ රඳවා ගනිමින් අපද්‍රව්‍ය පිටවීම අවම කරන ප්‍රවේශයකි.

(4) ව්‍යාපාරික ආයතනයක් ලබන ලාභයෙන් කොටසක් නැවත එම ව්‍යාපාරයේ ආයෝජනය කරමින් ව්‍යාපාරික චක්‍රය පවත්වාගෙන යාමේ මූල්‍ය ක්‍රියාකාරකමකි.

(5) ස්වභාවික සම්පත් භාවිතය සම්පූර්ණයෙන්ම නතර කර හුදෙක් කෘතිම අමුද්‍රව්‍ය පමණක් යොදා ගනිමින් සකස් කරනු ලබන නිෂ්පාදන ක්‍රියාවලියකි. (........)

(04) ''මිනිසා තම අවශ්‍යතා සපුරා ගත යුත්තේ අනාගත පරම්පරාවට එම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝනය නොකරමිනි.''

තිරසර සංවර්ධනය පිළිබඳව ප්‍රකට මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

(1) පිලිප් කොට්ලර් විසින් ය. (2) ඒබ්‍රහම් මැස්ලෝ විසින් ය.

(3) රොබට් සෝලෝ විසින් ය. (4) හාලම් බෘට්ලන්ඩ් විසින් ය.

(5) මූරිස් සිට්‍රොන්ග් විසින් ය. (........)

(05) සාර්ව පරිසරය ව්‍යාපාරයකට බලපෑම් කරන ආකාරය පිළිබඳ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) දේශපාලන පරිසරයේ සිදු කරන වෙනස්කම් ව්‍යාපාරයකට සෘජු බලපෑම් ඇති කරන අතර ඒවා පාලනය කළ හැකි මට්ටමේ පවතී.

(2) තාක්ෂණික පරිසරයේ සිදුවන වෙනස් වීම් ව්‍යාපාරයක මෙහෙයුම් පිරිවැය කෙරෙහි බලපෑම් ඇති නොකරයි.

(3) ආර්ථික පරිසරයේ උද්ධමන වේගය ඉහළ යාම මගින් ව්‍යාපාරයකට දුර්වලතා ඇති කරයි.

(4) ස්වභාවික පරිසරය හා සම්බන්ධ නීතිමය රාමු හුදෙක් ව්‍යාපාරික අවස්ථා පමණක් උත්පාදනය කරයි.

(5) ව්‍යාපාර ආචාර ධර්ම හා සමාජ වගකීම් සංකල්පය වර්ධනය වීම කෙරෙහි සමාජ හා සංස්කෘතික පරිසරය වෙනස් වීම ප්‍රබල ලෙස බලපානු ලබයි. (........)

(06) 2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව පුද්ගල ආදායම් බදු ප්‍රතිශත වන්නේ 6%, 18% 24 %, 30%, 36% යි. මාසික බදු නිදහස් සීමාව රු. 150 000 කි. වාර්ෂික ආදායම රුපියල් 30 000 000 වන පුද්ගලයෙකු වාර්ෂිකව ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය වන්නේ,

(1) රු. 30,000 (2) රු. 96,000 (3) රු. 36,000

(4) රු. 150,000 (5) රු. 60,000 (........)

(07) පාරිභෝගික අයිතිවාසිකම් හා පාරිභෝගික වගකීම් පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

අ : රජයේ හෝ වෙනත් බලධාරීන් විසින් පාරිභෝගිකයාට බලපාන තීරණ ගන්නා අවස්ථාවල දී පාරිභෝගිකයාගේ අදහස් යෝජනාවලට අවධානයක් යොමු කිරීමට ඇති අයිතිය සවන් යොමු කරවා ගැනීමේ අයිතිය ලෙස හැඳින් වේ.

ආ : පාරිභෝගික වගකීම් ලොවට ඉදිරිපත් කරන ලද්දේ පාරිභෝගික ජාත්‍යන්තරයේ හිටපු සභාපතිවරයෙකු වූ ''අන්වර් ෆසාර්'' විසිනි.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) අ සහ ආ ප්‍රකාශ දෙකම නිවැරදි වේ. (2) අ සහ ආ ප්‍රකාශ දෙකම නිවැරදි නොවේ.

(3) අ නිවැරදි අතර ආ නිවැරදි නොවේ. (4) අ මගින් ආ තහවුරු වේ.

(5) අ නිවැරදි නොවන අතර ආ නිවැරදි වේ. (........)

(08) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,

(1) තම හැකියා හා කුසලතා පිළිබඳව (2) පවතින තරගකාරීත්වය පිළිබඳව

(3) තමාගේ මූල්‍ය හැකියාව පිළිබඳව (4) බදු ගෙවීමට ඇති හැකියාව පිළිබඳව

(5) නිෂ්පාදිතයට ඇති වෙළෙඳපොළ පිළිබඳව (........)

(09) සමාගම් වර්ග කිහිපයක ලක්ෂණ පහත දැක්වේ.

A උපරිම සාමාජික සංඛ්‍යාව 50 කි. B අවම සාමාජික සංඛ්‍යාව 02 කි.

C ලාභ බෙදා හැරීමක් සිදු නොකරයි. D අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 01 කි.

E කොටස් නිකුත් කිරීමක් සිදු නොකරයි.

ඉහත ඒවායින් ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A B C (2) C D E (3) B C D (4) B C E (5) A C E (........)

(10) සාමාන්‍ය රේඛණයක් නොවන්නේ,



(1) (2) (3) (4) (5) (........)

(11) ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය කිරීම සිදුකරනු ලබන්නේ,

(1) මුදල් මණ්ඩලය මඟිනි (2) මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මඟිනි (3) පාලක මණ්ඩලය මඟිනි

(4) මහා භාණ්ඩාගාරය මඟිනි (5) පාර්ලිමේන්තුව මඟිනි (........)

(12) 2023 අංක 16 දරණ මහ බැංකු පනතින් ඉවත් කරන ලද, මහ බැංකුව සතු වූ කාර්යයක් ලෙස දැක්විය හැක්කේ,

(1) මුදල් ප්‍රතිපත්තිය නිර්ණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(2) විනිමය ප්‍රතිපත්තිය නිර්ණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(3) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා කළමනාකරණය කිරීම.

(4) රාජ්‍ය ණය කළමනාකරණය කිරීම.

(5) සංඛ්‍යා ලේඛණ රැස් කිරීම හා නිපදවීම. (........)

(13) පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඕනෑම අවධානමක් රක්ෂණය කළ හැකිය.

(2) හානි පූර්ණ මූල ධර්මය සියළු රක්ෂණ විෂය වස්තුන්ට අදාළ වේ.

(3) දේපලක් රක්ෂණ සමාගම් කිහිපයක රක්ෂණය කර ඇති විටක, එයට සිදුවන හානිය සඳහා මුළු වන්දිය සෑම සමාගමකින් ම ලබා ගත හැකිය.

(4) ක්‍රීඩකයන්ට තම ශරීර අවයව රක්ෂණය කර ගත හැකිය.

(5) දෙමාපියන්ට තම දරුවන් පිළිබඳ රක්ෂණය හිමිකමක් ඇත. (........)

(14) වෙළෙඳාමේ දී අතර මැදියන් යොදා ගනු දක්නට ලැබේ. මෙලෙස අතරමැදියන් යොදා ගැනීමේ වාසියක් නොවන්නේ,

(1) විවිධ නිෂ්පාදකයින් නිපදවන භාණ්ඩ පහසු ස්ථානයක දී අවශ්‍ය වේලාවට පාරිභෝගිකයාට ලබා ගත හැකි වීම.

(2) නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම.

(3) පාරිභෝගිකයාට වෙළෙඳපොළ තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි වීම.

(4) හුවමාරු ක්‍රියාවලිය සරල වීම.

(5) පාරිභෝගිකයාට අඩු මිලට නිෂ්පාදිත ලබාගත හැකි වීම. (........)

(15) සිල්ලර වෙළෙඳමේ නව ප්‍රවණතාවයක් වන්නේ කුමක් ද?

(1) අවසන් පාරිභෝගිකයාට නිෂ්පාදන අලෙවිය. (2) කුඩා ප්‍රමාණයෙන් අලෙවි කිරීම.

(3) පාරිභෝගිකයාට නව භාණ්ඩ හඳුන්වා දීම. (4) නිෂ්පාදකයාට තොරතුරු සැපයීම.

(5) දීර්ඝ වේලාවක් විවෘතව පැවතීම. (........)

(16) කළමනාකරුවෙකු සංවිධානමය අරමුණු ඉටු කරගැනීම සඳහා අනුගාමිකයින් අභිප්‍රේරණය කිරීම අයත්වන කළමනාකරණ භූමිකාව වන්නේ,

(1) අන්තර් පුද්ගල භූමිකාව - නියාමක (2) අන්තර් පුද්ගල භූමිකාව - නායකයා

(3) තොරතුරු භූමිකාව - සබඳතා පවත්වන්නා (4) තොරතුරු භූමිකාව - මාධ්‍ය ප්‍රකාශක

(5) තීරණ භූමිකාව - සාකච්ඡා කරන්නා (........)

(17) පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) කළමනාකරුවෙකුගේ භූමිකාව සාර්ථක වීමට නම් තාක්‍ෂණික, මානව හා සංකල්පනාත්මක යන කුසලතා තුනම පැවතීම බෙහෙවින් වැදගත් වේ.

(2) සෑම මට්ටමකම කළමනාකරුවෙකුටම මානව කුසලතා පැවතීම එක සේ වැදගත් වේ.

(3) සංකල්පනාත්මක කුසලතා වඩාත් වැදගත් වන්නේ පළමු පෙළ කළමනාකරුවන්ට ය.

(4) සංවිධානයක සමස්ථය දැකීම, දූරදර්ශී බව, තීක්‍ෂණව සිතීමේ හැකියාව යනාදිය සංකල්පනාත්මක කුසලතා යටතට අයත් වේ.

(5) පළමුපෙළ කළමනාකරුවන්ට තාක්‍ෂණික කුසලතා වැඩි වශයෙන් අවශ්‍ය වේ. (........)

(18) එකිනෙකට වෙනස් නිෂ්පාදන ක්‍රම කිහිපයක් පවතින අතර, ඉන් එක් නිෂ්පාදන ක්‍රමයක ලක්‍ෂණ කිහිපයක් නිර්ණායක තුනක් පදනම් කරගෙන පහත ඉදිරිපත් කර ඇත.

නිමවුමේ ප්‍රමාණය	-	ඉතා විශාලයි.
නිෂ්පාදිත පෙළ	-	එකක් පමණි.
නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශිලී බව	-	ඉතා පහළයි.

ඉහත ලක්‍ෂණ වලින් ඉදිරිපත් කර ඇත්තේ,

(1) කාණ්ඩ නිෂ්පාදන ක්‍රමයයි. (2) කාර්ය නිෂ්පාදන ක්‍රමයයි.

(3) ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයයි. (4) JIT ක්‍රමයයි.

(5) ක්‍රියාවලි නිෂ්පාදන ක්‍රමයයි. (........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(19) භාණ්ඩයක ගුණත්වයට බලපෑමක් නොවන අංගයක් වන්නේ,

(1) කල්පැවැත්ම. (2) ප්‍රමිතියට අනුකූල බව. (3) ආරක්ෂිත බව.
(4) මිලෙහි සාධාරණ බව. (5) විශ්වාසවන්ත බව. (........)

(20) වෙළෙඳපොළ ඛණ්ඩනය සඳහා යොදා ගනු ලබන මනෝ විද්‍යාත්මක සාධකයක් නොවන්නේ,

(1) සමාජ පන්ති (2) හුරුපුරුදු (3) පෞර්ෂත්වය
(4) හැසිරීම් රටාව (5) ජනගහන ඝනත්වය (........)

(21) භාණ්ඩ හා සේවා පිළිබඳව ඉලක්ක වෙළෙඳ පොළේ සිටින ගනුදෙනුකරුවන්ගේ මනසෙහි ඉඩක් ඇති කිරීම අලෙවිකරණයේදී හැඳින්වෙන්නේ,

(1) පිරිනැමුම් ලෙසය. (2) පිහිටුවීම ලෙසය. (3) හැඟීම ලෙසය.
(4) නිරත වීම ලෙසය. (5) තෘප්තිය ලෙසය. (........)

(22) කෙටි කාලීන ආයෝජන තීරණයක් නොවන්නේ,

(1) මුදල් කළමනාකරණ තීරණ (2) වෙළෙඳ තොග පිළිබඳ තීරණ
(3) ණයගැතියන් පිළිබඳ තීරණ (4) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම පිළිබඳ තීරණ
(5) බැංකු අයිරා පිළිබඳ තීරණ (........)

(23) මූල්‍ය කළමනාකරණයේදී ලාභදායීත්වය රඳවා ගැනීමට අදාළ තීරණයක් වන්නේ,

(1) නිවැරදි මිල තීරණය (2) මුදල් අයවැයකරණය
(3) මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීම. (4) විවිධ අරමුදල් නඩත්තු කිරීම.
(5) ද්‍රවශීලතා අනුපාත ගණනය කිරීම. (........)

(24) වක්‍ර මූල්‍ය සම්පාදන මූල්‍ය මාර්ගයක් වන්නේ,

(1) ක්ෂය වෙන් කිරීම (2) කොටස් නිකුතුව (3) බැංකු ණය
(4) වාණිජ පත්‍රිකා (5) ණයකර නිකුතුව (........)

(25) ආයතනයකට සේවකයින් ආකර්ෂණය කර ගන්නා ක්‍රම කිහිපයක් පහත වේ.

1 කුසලතා ලේඛන 2 ගැසට් නිවේදන 3 අනුප්‍රාප්තික සැලසුම්
4 පූර්ව අයදුම්කරුවන් 5 වෘත්තීය සංගම් මගින්

ඉහත ආකර්ෂණ ක්‍රම අභ්‍යන්තර හා බාහිර වශයෙන් වෙන් කළ පසු ලැබෙන පිළිතුර වන්නේ,

(1) අභ්‍යන්තර : 1, 3, 5 බාහිර : 2, 4
(2) අභ්‍යන්තර : 1, 4, 5 බාහිර : 2, 3
(3) අභ්‍යන්තර : 1, 4 බාහිර : 2, 3, 5
(4) අභ්‍යන්තර : 1, 3 බාහිර : 2, 4, 5
(5) අභ්‍යන්තර : 2, 4 බාහිර : 1, 3, 5 (........)

(26) සංවේතන පද්ධතියක මූලිකාංග ඇතුලත් කාණ්ඩය වන්නේ,

(1) පුහුණුව, සංවර්ධනය හා දිරි දීමනා ය.
(2) උසස් වීම්, වැටුප් වැඩි වීම් හා අනෙකුත් ප්‍රතිලාභ ය.
(3) වේතන, දිරි දීමනා හා අනෙකුත් ප්‍රතිලාභ ය.
(4) වේතන, කාර්ය සාධනය හා පුහුණුව ය.
(5) දැනුම, වැඩ සටහන් හා දිරි දීමනා ය. (........)

iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(27) මානව සම්පත් සහායිකාවක් (HR Assistant) වන හංසි ආයතනයේ සේවකයින් සම්බන්ධ ලිපි සකස් කිරීම්, සේවක පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම, සේවකයින්ගේ දත්ත තොරතුරු පවත්වාගෙන යෑම හා සෑම මාසයක් අවසානයේ දී සේවකයින්ගේ වැටුප් සකස් කිරීම් සිදු කරනු ලබයි.

ඉහත තද අකුරින් මුද්‍රිතව ඇති කාර්යයන් ඉටුකිරීම සඳහා හංසිට යොදාගත හැකි කාර්යාල ස්වයංක්‍රීයකරන උප පද්ධති ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) දත්ත පදනම, ලිපිගොනු හුවමාරුව, විද්‍යුත් ලිපිගොනු, පැතුරුම් පත්

(2) වදන් සැකසුම් පද්ධති, විද්‍යුත් තැපැල, පැතුරුම් පත් , ලිපිගොනු හුවමාරුව

(3) දත්ත පදනම, මල්ටිමීඩියා, වදන් සකසුම් පද්ධති, පැතුරුම් පත්

(4) වදන් සැකසුම් පද්ධති, විද්‍යුත් ලිපිගොනු, දත්ත පදනම, මල්ටිමීඩියා

(5) වදන් සැකසුම් පද්ධති, විද්‍යුත් තැපැල, දත්ත පදනම, පැතුරුම් පත් (........)

(28) පරිගණක ජාල පිළිබඳ ප්‍රකාශයන් කිහිපයක් පහත වේ.

A අන්තර්ජාලය පදනම් කර ගනිමින් ව්‍යාපාර ආයතන තුළ ඇති දත්තවලට ළඟා වීමට පිටස්තර පුද්ගලයින්ට ඉඩ සලසා ඇති ආයතනමය ජාලය අභ්‍යන්තර ජාලය යි.

B අභ්‍යන්තර ජාල තුළින් බාහිර ජාල ගොඩනගා ගනී.

C පිටස්තර ඕනෑම පුද්ගලයෙකුට බාහිර ජාලවලට සම්බන්ධ විය හැකිය.

ඉහත ප්‍රකාශනයන්ගෙන්,

(1) A, B හා C නිවැරදි ය.

(2) A, B හා C වැරදි ය.

(3) A හා B නිවැරදි වන අතර C වැරදි ය.

(4) A හා C වැරදි වන අතර B නිවැරදි ය.

(5) B හා C නිවැරදි වන අතර A වැරදි ය. (........)

(29) ව්‍යාපාරයේ සමස්ථ සැලැස්ම පිළිබඳ දළ අවබෝධයක් ලබා ගත හැකි වන්නේ,

(1) ව්‍යාපාරයේ මෙහෙයුම් සැලැස්ම අධ්‍යයනයෙනි.

(2) ව්‍යාපාර විස්තරය අධ්‍යයනයෙනි.

(3) ව්‍යාපාර මූල්‍ය සැලැස්ම අධ්‍යයනයෙනි.

(4) ව්‍යාපාරයේ විධායක සාරාංශය අධ්‍යයනයෙනි.

(5) ව්‍යාපාර සැලැස්මේ මුල් පිටුව අධ්‍යයනයෙනි. (........)

(30) මූල්‍ය සැලැස්මක අඩංගු කරුණක් නොවන්නේ,

(1) ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය (ප්‍රාග්ධන අවශ්‍යතාව)

(2) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

(3) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය

(4) ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(5) ණය ආපසු ගෙවීමේ සටහන (........)

- **අංක 31 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට සුදුසු වචන හිස්තැන මත ලියන්න.**

(31) (අ) චක්‍ර නිෂ්පාදනයේදී නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා අතර සම්බන්ධතාවය ඇති කරන්නේ .... මඟිනි. ව්‍යාපාර විකාශනයේදී මහා පරිමාණ නිෂ්පාදන බිහිවීමට බලපෑනු ලැබුවේ .... යි.

(ආ) පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම මෙන්ම .... පිළිබඳ සැලකිලිමත් වීම ද ව්‍යාපාර .... වේ.

(32) (අ) ලොව ප්‍රථම සමූපකාර සමිතිය ආරම්භ වූයේ .... වසරේ එංගලන්තයේ පිහිටි .... නගරයේ දී ය.

(ආ) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගමක නම යෙදීමේ දී පෞද්ගලික සමාගමක නම්, ... ලෙස ද, ලැයිස්තුගත සමාගමක නම් .... ලෙස ද අවසන් විය යුතුය.

(33) (අ) ව්‍යාපාර සංවිධාන වර්ග අතරින් නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධාන වර්ග ලෙස කේවල ස්වාමි ව්‍යාපාර, ... හා .... නම් කළ හැක.

(ආ) ව්‍යාපාර සංයෝජනය වන ප්‍රධාන ආකාර වන්නේ .... හා .... ය.

(34) (අ) 2025 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රු. .... නෝට්ටුවක් හඳුන්වා දුන් අතර, එය ශ්‍රී. ල. ම. බැංකුවේ .... වන සංවත්සරය වෙනුවෙන් නිකුත් කරන ලදී.

(ආ) ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන අතර වටිනාකමින් ඉහළ ගනුදෙනු පියවීම සඳහා භාවිත කරන ගෙවීම් පද්ධතිය ලෙස .... හැඳින්විය හැකි අතර එය ශ්‍රී. ල. මහ බැංකුව සපයන .... පහසුකම කි.

(35) (අ) ප්‍රවාහනය හුදෙක් මාධ්‍යයක් පමණක් නොව .... කිහිපයකින් සමබරව සංවර්ධනය වීමෙන් සැකසුනු .... කි.

(ආ) ගබඩාවක් ස්ථානගත කිරීමේ දී ගොඩනැගිල්ලක .... හා ගොඩනැගිල්ල තුළ .... කිරීමේ ඉඩ කඩ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

(36) (අ) අපනයනය කරනු ලබන භාණ්ඩ වල මිල, ... කොන්දේසි ආදී විස්තර ඇතුලත් ලේඛණය .... නම් වේ.

(ආ) අනෙකුත් සංවිධානවල කාර්යභාරයන්ගෙන් තම සංවිධානය වෙන්කරගත හැකි ප්‍රකාශය .... වන අතර ආයතනයක ස්ථාපිත කරගත් පරමාර්ථ හා අරමුණු ලඟා කර ගැනීමේ දී කටයුතු කළයුතු ආකාරය සඳහා මඟ පෙන්වන දර්ශක .... ලෙස හැඳින් වේ.

(37) (අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණයේ (EOQ) දී .... පිරිවැය හා .... පිරිවැය එකිනෙකට සමාන වේ.

(ආ) නිෂ්පාදිත වල ආකෘති නිර්මාණයටත්, ඒවා විවිධ කෝණයන්ගෙන් විග්‍රහ කිරීමටත් .... ක්‍රමය යොදා ගන්නා අතර, ඊට පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය එකතු කළ විට .... ක්‍රමය බිහි වේ.

(38) (අ) විෂම ගති ලක්ෂණ වලින් සමන්විත සමස්ථ වෙළඳ පොළ .... ගති ලක්ෂණ වලින් යුක්ත වූ කණ්ඩායම් වලට බෙදා වෙන් කර ගැනීම .... ලෙස හැඳින්වේ.

(ආ) ව්‍යාපාරයේ අයිතිකරුවන්ගේ .... උපරිම කිරීම .... කළමනාකරණයේ ප්‍රධාන අරමුණ යි.

(39) (අ) සේවක දුක්ගැනවිලි වලට සවන්දීම හා ඒවා නිරාකරණය හෙවත් විසඳීම සඳහා ආයතනයක් තුල වෙනම තනතුරක් ඇති කල විට එම තනතුර .... නමින් හඳුන්වන අතර, කිසියම් වෘත්තීය ප්‍රශ්නයක් හේතු කොටගෙන සේවායෝජකයන් හා සේවකයන් අතර හෝ සේවකයන් - සේවකයන් අතර හෝ ඇතිවන ගැටුම් හෝ භේද .... ලෙස හඳුන්වනු ලබයි.

(ආ) අනාගත රැකියා කටයුතු, රාජකාරී හා වගකීම් ඉටු කිරීමට සේවකයා සූදානම් කිරීම .... මගින් සිදුවන අතර වර්තමාන රැකියාවේ කටයුතු රාජකාරී හා වගකීම් ඉටු කිරීමට සේවකයා සූදානම් කිරීම .... මගින් සිදු වේ.

(40) (අ) ව්‍යාපාර සැලැස්මක වෙළෙඳ පොළ, තරඟකාරීත්වය, විකුණුම් උපාය මාර්ග, විකුණුම් පුරෝකථන ආදී තොරතුරු සවිස්තරව ඉදිරිපත් කරන කොටස .... ලෙස හඳුන්වන අතර අමුද්‍රව්‍ය අවශ්‍යතා, සේවක අවශ්‍යතා, කර්මාන්තශාලා බිම් සැලැස්ම ආදී තොරතුරු සවිස්තර ව ඉදිරිපත් කරන කොටස .... ලෙස හඳුන්වයි.

(ආ) සංවිධානයක ඇති විවිධ අංශ හා තනතුරු අතර පවත්නා අන්තර් සම්බන්ධතා සංවිධාන ව්‍යුහය ලෙස හැඳින්වෙන අතර එය .... කින් සාරාංශ කර දැක්විය හැකිය. බාහිර පරිසර සාධක ද අගයමින් ව්‍යාපාර අදහස් සියල්ල අතරින් යෝග්‍ය ව්‍යාපාර අදහස හඳුනා ගැනීම සඳහා සියලු ම අදහස් ඇගැයීමට ලක් කිරීම .... ලෙස හැඳින් වේ.

- **ප්‍රශ්න අංක 41 සිට 50 දක්වා වූ ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) පහත සඳහන් ව්‍යාපාර සංවිධාන ලියාපදිංචිය / සංස්ථාපනය සඳහා බලපාන පණත් නම් කරන්න.

1. හවුල් ව්‍යාපාර - ....
2. සී/ස පෞද්ගලික සමාගම් - ....
3. සමූපකාර - ....
4. තේවල ස්වාමි ව්‍යාපාර - ....

(42) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කරගත හැකි ආකාර වන්නේ,

1. ....
2. ....
3. ....
4. ....

(43) පහත සඳහන් අවස්ථාවල කාර්යක්ෂමතාවය හා සඵලදායිතාවය හඳුනා ගන්න.

1. නිවැරදි දේ නිවැරදි ලෙස කිරීම - ....හා කාර්යක්ෂම ය.
2. වැරදි දේ නිවැරදි ලෙස කිරීම - ....හා කාර්යක්ෂම ය.
3. වැරදි දේ වැරදි ලෙස කිරීම - ....හා අකාර්යක්ෂම ය.
4. නිවැරදි දේ වැරදි ලෙස කිරීම - ....හා අකාර්යක්ෂම ය.

PAST PAPERS WIKI

(44) JIT ක්‍රමයේ වාසි 04 ක් දක්වන්න.

1. ....
2. ....
3. ....
4. ....

(45) ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් දක්වන්න.

1. ....
2. ....
3. ....
4. ....

(46) මිල තීරණය කිරීමේ ක්‍රමවේදයේ මුල් අදියර 04 ක් පිළිවෙලින් ලියා දක්වන්න.

1. ....
2. ....
3. ....
4. ....

(47) ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණ අනුව බැංකු නොවන නමුත් තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන වර්ග 04 ක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

(48) සාමූහික ගිවිසුමක් මගින් සේවකයාට හිමිවන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

(49) ව්‍යාපාර සැලැස්මක ඇතුළත් විය යුතු ප්‍රධාන අංග හතරක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

(50) පහත සංකේත වලින් අදහස් වන දේ ඉදිරියෙන් ලියන්න.

1. .... 2. ....

3. .... 4. ....

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

විභාග අංකය: ....

ව්‍යාපාර අධ්‍යයනය - II

කාලය පැය 03 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

I කොටස

01. සුව සපිරි සමාගම අපනයන ඉලක්ක කර ගනිමින් ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම අරමුණ කරගෙන කාබනික එළවළු සහ පළතුරු නිශ්පාදන කරනු ලබන සමාගමකි. ඔවුන් සෞඛ්‍යාරක්ෂිතව කාබනික ආහාර සකස් කරන්නේ නවීන යන්ත්‍ර සූත්‍ර භාවිත කරමිනි. එසේම ඔවුන් බැහැර කරන ජලය නැවත ප්‍රතිචක්‍රීකරන ක්‍රියාවලියක් ඔස්සේ භාවිතයට ගැනීම ද සිදුකරයි. ආයතනයට කාලයක් ප්‍රයෝජනයට ගත් එම යන්ත්‍ර සූත්‍රවල නිෂ්පාදන තාක්ෂණය යල්පැන ගිය නිසා ඒවා අලුතින් ගෙන්වීම අවශ්‍ය වුවද පසුගිය අවුරුදු කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ විදේශ විනිමය අර්බුදය හමුවේ එම උපාංග ගෙන්වීමේ පිරිවැය ඉහළ යාම හේතුවෙන් ගෙන්වීම සීමා කිරීමට සිදුවිය.

මෙම සමාගම සිය සැපයුම් දාමය තුළ කුඩා පරිමාණ ගොවීන් පන්සියක් පමණ සම්බන්ධ කරගෙන සිටින අතර එසේම ඔවුන්ට සාධාරණ මිලක් ලබාදීමටත් කටයුතු කරයි. නමුත් මෑතකදී සමාගම විසින් සිදුකළ විගණනයක දී හෙළි වූයේ එක්තරා ගොවීන් පිරිසක් රහසිගතව රසායනික පොහොර භාවිත කරන බවය. එවැනි තත්වයන්වල අයහපත් බලපෑම අවම කිරීමට මෙන් ම තිරසර බව තහවුරු කිරීම සඳහා ද ආයතනය 'හරිත පාලනය' (Green Governance) කෙරෙහි අවධානය යොමු කිරීමට තීරණය කරන ලදී.

භෞතිකව පමණක් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගිය සුව සපිරි සමාගමට තරගකාරීත්ව අභියෝග හමුවේ වෙළෙඳපළ පුළුල් කිරීමේ අවශ්‍යතාවය මතුවිය. ඒ අනුව, සුව සපිරි සමාගම ඍජුව පාරිභෝගිකයා සම්බන්ධ කර ගැනීම සඳහා ඇනවුම් විද්‍යුත් මාර්ග ඔස්සේ ලබා ගනී.

(i) (අ) සුව සපිරි ආයතනය විසින් ඉටුකරන මිනිස් අවශ්‍යතාවය හා වුවමනාව කුමක්ද? (ල. 01)

(ආ) සුව සපිරි ආයතනය විසින් සපයනු ලබන්නේ භාණ්ඩ ද සේවා ද? (ල. 01)

(ඇ) විදේශ විනිමය අර්බුදය කුමන පරිසර සාධකයකට අයත් ද? (ල. 02)
එය ව්‍යාපාරයට කෙබඳු බලපෑමක් ඇති කරන්නේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) (අ) "මෙම ව්‍යාපාරය ආචාර ධර්ම විරෝධීව හැසිරෙන ව්‍යාපාරයකි." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ල. 02)

(ආ) ඉහත සිද්ධියේ සඳහන් ආයතනය මෙහෙයුම් අංශයට අදාළ ආචාර ධර්ම පිළිපදින බව පෙනේ. එම මෙහෙයුම් අංශයට අදාළ ආචාර ධර්ම හඳුනාගන්න. (ල. 02)

(iii) ඍජුව පාරිභෝගිකයා සම්බන්ධ කර ගැනීම සඳහා මෙම ආයතනය ගනු ලබන සිද්ධියේ සඳහන් ක්‍රියාමාර්ගය කුමක්ද? එහි වාසි හා සීමා දෙක බැගින් දක්වන්න. (ල. 04)

(iv) (අ) "සුව සපිරි සමාගම තිරසර ව්‍යාපාරයකි." මෙම ප්‍රකාශය තහවුරු කරන්න. (ල. 03)

(ආ) "හරිත පාලනය" (Green Governance) යනු කුමක්ද? (ල. 01)

(v) ව්‍යාපාර ගති ලක්ෂණයක් ලෙස අවදානම යන්න නිර්වචනය කර ඉහත සිද්ධියේ සඳහන් සමාගම මුහුණ දෙන ප්‍රධානතම අවදානම් දෙකක් සඳහන් කරන්න. (ල. 04)

(ල. 20)

02. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය රජය ආරම්භ කර ඇත්තේ චීන සමාගමක් වන CHEC Port City Colombo (Pvt) Ltd සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ආකෘතිය යටතේ ය.

(i) (අ) රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යනු කුමක්ද? (Public - Private Partnership / PPP) (ල. 02)

(ආ) මෙවැනි ආකෘති යටතේ ආරම්භ කරන මහා පරිමාණ ව්‍යාපෘති මගින් රටක ආර්ථික සංවර්ධනයට වන බලපෑම කුමක්ද? (ල. 02)

ප්‍රසිද්ධ බේකරි නිෂ්පාදන ආයතනයක සේවයේ නියුක්තව සිටි සුරංග ''රංග බේකර්ස්'' නමින් තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර ලියාපදිංචි කරන ලදී. ව්‍යාපාරය පුළුල් වීමත් සමඟ තනිව කළමනාකරණ කටයුතු කර ගැනීම දුෂ්කර වූ හෙයින් විවිධ ගැටලු මතුවිය. මීට පිළියමක් ලෙස කළමනාකරණ උපාධිධාරියෙකු වූ තම සොහොයුරා වන මිහිරංග ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීමටත්, ව්‍යාපාරයේ හිමිකාරීත්වය පවුලේ සාමාජිකයින් අතර පමණක් පවත්වාගෙන යාමටත් තීරණය කළේය.

(ii) (අ) ''රංග බේකර්ස්'' ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් දක්වන්න. (ල. 02)

(ආ) ''රංග බේකර්ස්'' ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි හතරක් සඳහන් කරන්න. (ල. 02)

(iii) (අ) සුරංගගේ සොහොයුරා ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීමෙන් පසු ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් යෝජනා කර ඒ සඳහා සුදුසු ව්‍යාපාර නාමයන් දෙකක් ද යෝජනා කරන්න. (ල. 02)

(ආ) ''රංග බේකර්ස්'' හිමිකරු වන සුරංග ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී මුහුණ දෙන සීමාවන් හතරක් සඳහන් කරන්න. (ල. 02)

(iv) (අ) ව්‍යාපාර සංයෝජනය වීම තුළින් ව්‍යාපාර වලට අත් වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) සුදුසු ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන ඉදිරිපසට සංයෝජන සහ පසුපසට සංයෝජනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(v) (අ) රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පාරිභෝගිකයින්ට අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) පෞද්ගලික අංශය කෙතරම් ශක්තිමත් වුවත් ව්‍යාපාර කටයුතු සඳහා රජය මැදිහත්වීමට හේතු හතරක් දක්වන්න. (ල. 02)

03. (i) (අ) ව්‍යාවහාර මුදල් යන්න හඳුන්වා එහි ප්‍රධාන ප්‍රභේද 02 නම් කරන්න. (ල. 02)

(ආ) ඔබ සඳහන් කළ එම ප්‍රභේද දෙකෙහි වෙනස්කම් 02 ක් ලියන්න. (ල. 02)

(ii) (අ) ජංගම ගිණුමක් හා ඉතිරිකිරීමේ ගිණුමක් අතර වෙනස්කම් 04 ක් ලියන්න. (ල. 02)

(ආ) රේඛිත චෙක්පතක් හා රේඛණය නොකළ චෙක්පතක් අතර වෙනස්කම් 02 ක් ලියන්න. (ල. 02)

(iii) (අ) චෙක්පතක් යනු ගනුදෙනු කළ හැකි ලියවිල්ලකි. චෙක්පතක් තව දුරටත් ගනුදෙනු වීම වැලැක්වීමට ඔබට කළහැකි යෝජනා 02 ක් ලියන්න. (ල. 02)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ හා අනෙක් අරමුණ ලියා දක්වන්න. (ල. 02)

(iv) (අ) ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබාගත් පුද්ගලයෙකුට තවදුරටත් එකී ඔප්පුව නඩත්තු කරගෙන යා නොහැකි නම්, ඒ වෙනුවෙන් ගතහැකි විකල්ප ක්‍රියාමාර්ග දෙක නම් කරන්න. (ල. 02)

(ආ) ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය අතර වෙනස්කම් 04 ක් ලියන්න. (ල. 02)

(v) ඔබ පාසලේ විදුහල්පති තුමා උදෑසන රැස්වීම ඇමතීම උදාහරණයට ගෙන එහි අන්තර්ගත සන්නිවේදන මූලිකාංග හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 04)

04. සිරිකමල් මහතා විදේශ රටවලින් රෙදි, නූල්, බොත්තම් ආදිය ආනයනය කර ඔහුගේ ඇගලුම් කර්මාන්ත ශාලාව තුල ඇගලුම් නිපදවා තමාගේ නිමි ඇඳුම් අලෙවි සැල් සහ වෙනත් ප්‍රදර්ශනාගාර හරහා අලෙවි කරන අතර තවත් කොටසක් අපනයනය කරනු ලබයි.

ඉහත සිදුවීම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න.

(i) (අ) ගබඩාකරණය යනු කුමක්ද? (ල. 02)

(ආ) සිරිකමල් මහතාගේ ව්‍යාපාරයේ නිමි ඇඳුම් ගබඩාකරණය සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාවලිය ලියා දක්වන්න. (ල. 02)

(ii) (අ) ප්‍රවාහන හා සැපයුම් සේවා යන්න හඳුන්වන්න. (ල. 02)

(ආ) මෙම ව්‍යාපාරය කුමන සැපයුම් සේවා වර්ගයකට අයත් වේද? ඔබගේ පිළිතුරට හේතු සඳහන් කරන්න. (ල. 02)

(iii) සිරිකමල් මහතාගේ ව්‍යාපාරය ඇසුරින් වෙළඳාමේ විවිධ ප්‍රභේද පැහැදිලි කරන්න. (ල. 04)

(iv) වෙළඳාමේ දී විවිධ ලියවිලි භාවිත කිරීමට සිදු වේ. මෙම ව්‍යාපාරිකයාට භාවිත කිරීමට සිදුවන ලියවිලි හතරක් නම්කර පැහැදිලි කරන්න.

(v) (අ) තොග වෙළඳාමේ ප්‍රධාන ලක්ෂණය හා වෙනත් ලක්‍ෂණ 03 ක් ලියන්න. (ල. 02)

(ආ) තොග වෙළෙන්දාගෙන් නිෂ්පාදකයාට ඉටුවන සේවා 02 ක් ලියන්න. (ල. 02)

II කොටස

05. නිම්රෝ ෆුඩ්ස් සමාගම වියළන ලද පළතුරු දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපලට සැපයීම ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත කරගත් ව්‍යාපාර ආයතනයකි. මෙහි ප්‍රධාන විධායක නිලංග සේවකයින්ගේ ද අදහස් ලබාගෙන අනාගත කටයුතු සැලසුම් කිරීම කෙරෙහි දැඩි උනන්දුවකින් කටයුතු කරන අතර සියලුම මට්ටම්වල කළමනාකරුවන් සමඟින් සාකච්ඡා කර තීරණ ගැනීමට ද කාල වේලාව වෙන් කර ගනී. තවද නව ඇසුරුම් ක්‍රම, කල් තබා ගැනීමේ තාක්ෂණික ක්‍රම පිළිබඳව පර්යේෂණ සිදු කරනු ලබන අතර, ඒවායේ ප්‍රතිඵල මත නව ව්‍යාපෘති හඳුන්වාදීමට ද උනන්දු වේ. ඉහළ ගුණත්වයකින් යුත් භාණ්ඩ පාරිභෝගිකයින් අතට පත් කිරීම නිසාම ආයතනය අඛණ්ඩව වසර කිහිපයක් ම සම්මානයට ද පාත්‍රව ඇත.

(i) (අ) නිලංග සැලසුම් සකස් කිරීමේදී අවධානය යොමු කළ යුතු මූලධර්ම හතරක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) ව්‍යාපාර ආයතනයකට පාලන කාර්ය සාර්ථක කර ගැනීම සඳහා සැලසුම්කරණය කෙතරම් වැදගත් වන්නේ දැයි පැහැදිලි කරන්න. (ල. 02)

(ii) (අ) කළමනාකරණ භූමිකාවන්හි තීරණ භූමිකාව තුළ නිලංග ඉටු කරන කාර්යයන් සඳහා නිදසුන් උපභූමිකා දෙකක් යටතේ දක්වන්න. (ල. 02)

(ආ) පර්යේෂණ හා සංවර්ධනය යන්න පැහැදිලි කර නිම්රෝ ෆුඩ්ස් සමාගම වෙත ඉන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(iii) (අ) ඉහත සිද්ධියට අනුව නිලංග අනුගමනය කරන නායකත්ව ශෛලිය හඳුනා ගන්න. (ල. 01)

(ආ) ඉහළ සාර්ථකත්වයක් ලඟාකර ගෙන ඇති මෙම ආයතන අනුගමනය කරන්නට ඇතැයි සැලකිය හැකි පාලන ශිල්ප ක්‍රම / විධි නම් කරන්න. (ල. 03)

(iv) ඉහත සිද්ධි අනුව පරිවර්තන ක්‍රියාවලිය සටහනක් මගින් දක්වන්න. (ල. 04)

(v) (අ) නිම්රෝ ෆුඩ්ස් සමාගමට ගුණත්ව පාලනය/ තත්ත්ව පාලනය සඳහා භාවිතා කළ හැකි ශිල්ප ක්‍රම මොනවා ද? (ල. 02)

(ආ) ආයතනයේ ශ්‍රම ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාර 02 ක් දක්වන්න. (ල. 02)

06. (i) පහත දැක්වෙන්නේ නිමේෂාගේ ව්‍යාපාරයේ තොග සම්බන්ධ තොරතුරු කිහිපයකි.

යළි ඇණවුම් ප්‍රමාණය	-	ඒකක 5000
යළි ඇණවුම් කාලය	-	අවම දින 10
		උපරිම දින 20
ද්‍රව්‍ය පරිභෝජනය	-	දිනකට අවම ඒකක 80
		දිනකට උපරිම ඒකක 100

(a) යළි ඇණවුම් මට්ටම (ල. 01)

(b) අවම තොග මට්ටම (ල. 01)

(c) උපරිම තොග මට්ටම (ල. 02)

(ii) (අ) වෙළඳපොළ ඛණ්ඩනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 02)

(ආ) අලෙවි මිශ්‍රය ගැනුම්කරුගේ දෘෂ්ඨියෙන් දක්වන්න. (ල. 02)

(iii) නිෂ්පාදිතයක ජීවන චක්‍රයේ ප්‍රධාන අදියර නම් කර ඒ ඒ අදියරයේදී යෙදිය යුතු උපාය මාර්ගය බැගින් ලියා දක්වන්න. (ල. 04)

(iv) විකුණුම් ප්‍රවර්ධනය යන්න හඳුන්වා, විකුණුම් ප්‍රවර්ධනයේ ප්‍රධාන ආකාර 03 ක් ලියා දක්වන්න. (උදාහරණ 02 බැගින්) (ල. 04)

(v) (අ) මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් නම් කරන්න. (ල. 02)

(ආ) මූල්‍ය පද්ධතිය යන්න හඳුන්වන්න. (ල. 02)

07. (i) (අ) මූල්‍ය වෙළෙඳපළ යන්න හඳුන්වන්න. (ල. 02)

(ආ) මූල්‍ය වෙළෙඳපළේ ප්‍රධාන ප්‍රභේද 02 කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)

(ii) මූල්‍ය උපකරණ 04 ක් නම් කර එවැනි මූල්‍ය උපකරණ තුලින් හිමිවන ඍජු ප්‍රතිලාභ 04 ක් ලියා දක්වන්න. (ල. 04)

රන්රස බිස්කට් සමාගම ශ්‍රී ලංකාවේ ප්‍රකට ආහාර නිෂ්පාදන ආයතනයකි. තරඟකාරී ව්‍යාපාරයක් වෙළෙඳපලෙන් ඉවත් වීම හේතුවෙන් රන්රස ආයතනයේ නිෂ්පාදිතවලට ඉහළ ඉල්ලුමක් ඇතිවිය. එම ඉල්ලුම සැපයීම සඳහා නිෂ්පාදන ධාරිතාවය කෙටි කාලෙකින් ඉහළ නැංවීමට කළමනාකරනය කටයුතු කරන ලදි. සේවක වැඩමුර දීර්ඝ කිරීම, නව තාක්ෂණික යන්ත්‍ර කිහිපයක් ලබාගැනිම එහි ප්‍රතිඵලයකි. නමුත් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් පුහුණුවක් සේවකයින්ට යාවත්කාලීනව ලබා නොදෙන ලදී. මෙම තත්ත්වය යටතේ සේවක දුක්ගැනවිලි ඉහළ ගිය අතර වර්ෂය අවසානයේ ආයතනයේ ඉතිරිවූයේ සේවකයින් 550 න් 450 ක් පමණි.

(iii) (අ) සේවක දුක්ගැනවිල්ලක් යනු කුමක්ද? (ල. 02)

(ආ) ඉහත සමාගමේ සේවකයින්ගේ දුක් ගැනවිලි ඇතිවීමට බලපාන්නට ඇතැයි සිතිය හැකි හේතු මොනවාද? (ල. 02)

(iv) (අ) රන්රස ආයතනයේ සේවක පිරිවැටුම ප්‍රතිශතයක් ලෙස ගණනය කර දක්වන්න. (ල. 02)

(ආ) සේවක පිරිවැටුම ඉහළ යාමෙන් ආයතනයක මුහුණදීමට සිදුවන ගැටළුකාරී තත්ත්වයන් මොනවාද? (ල. 02)

(v) පුහුණුව හා සංවර්ධනයෙන් සේවා යෝජකයාට හා සේවකයාට හිමිවන ප්‍රතිලාභ හතර බැගින් දක්වන්න. (ල. 04)

08. (i) (අ) පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක ඇතුලත් වන උපාංග හතරක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) පහත සඳහන් තොරතුරු පද්ධති උපයෝගි කරගෙන ව්‍යාපාර ආයතනයක් තුළ සිදුකරන කාර්යයන් දෙක බැගින් දක්වන්න.
මෙහෙයුම් කළමනාකරණ තොරතුරු පද්ධති
අලෙවිකරණ තොරතුරු පද්ධති. (ල. 02)

(ii) (අ) ''ව්‍යාපාර ආයතනයකට තොරතුරු පද්ධති අවශ්‍ය වන්නේ ඉහළ කළමනාකාරීත්වයට අදාළ තීරණ ගැනීම සඳහා පමණි.'' මෙම ප්‍රකාශය කෙරෙහි ඔබගේ අදහස් දක්වන්න. (ල. 02)

(ආ) උපක්‍රමික මට්ටමේ තොරතුරු පද්ධති යන්න පැහැදිලි කරන්න. (ල. 02)

(iii) කළමනාකරණ මට්ටම අනුව වර්ග කරන තොරතුරු පද්ධති හා භාවිතය අනුව වර්ග කරන තොරතුරු පද්ධති අතර අන්තර් සම්බන්ධතාව ගැලීම් සටහනක් මගින් දක්වන්න. (ල. 04)

(iv) (අ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේදි සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) අලෙවිකරණ සැලැස්මක තරගකාරීත්ව විශ්ලේෂණයක දී ඉදිරිපත් කළ යුතු තොරතුරු හතරක් සඳහන් කරන්න. (ල. 02)

(v) ව්‍යාපාර විස්තරය යනු කුමක්දැයි පැහැදිලිකර එහි සඳහන් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ල. 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය - 2026

13 ශ්‍රේණිය | ව්‍යාපාර අධ්‍යයනය | පිළිතුරු පත්‍රය

I පත්‍රය

1 -(3) 2 -(3) 3 -(3) 4 -(4) 5 -(5) 6 -(2) 7 -(1) 8 -(4) 9 -(4) 10-(4)
11-(3) 12-(4) 13-(4) 14-(5) 15-(5) 16-(2) 17-(3) 18-(3) 19-(4) 20-(5)
21-(2) 22-(5) 23-(1) 24-(3) 25-(4) 26-(3) 27-(5) 28-(4) 29-(4) 30-(2)

(31) (අ) වෙළෙඳාම, කාර්මික විප්ලවය (ආ) සමාජ වගකීම, ප්‍රවණතාවයකි.

(32) (අ) 1844, රොච්ඩේල් (ආ) (පෞද්.) සමාගම / (Pvt) Ltd, පී.එල්.සී. / (පොදු සමාගම)/ PLC

(33) (අ) හවුල් ව්‍යාපාර, රාජ්‍ය දෙපාර්තමේන්තු (ආ) ඒකාබද්ධ වීම, අත්පත් කර ගැනීම්.

(34) (අ) 2 000, 75 (ආ) තත්ත්කාලීන දළ පියවීම් පද්ධතිය / RTGS මූල්‍ය යටිතල

(35) (අ) මූලිකාංග, පද්ධතියකි. (ආ) පිරියත සැලැස්ම, චලනය

(36) (අ) ගෙවීම්, ඉන්වොයිසිය (ආ) මෙහෙවර ප්‍රකාශය / නිෂ්ටාව, ප්‍රතිපත්ති

(37) (අ) තොග පවත්වාගෙන යාමේ, තොග ඇණවුම් කිරීමේ

(ආ) පරිගණක ආධාරක නිර්මාණකරණ ක්‍රම / CAD , පරිගණක සමෝධානික නිෂ්පාදනය (CAM)

(38) (අ) සමජාතීය, වෙළෙඳපල බණ්ඩනය

(ආ) ධනය / ව්‍යාපාරය හා සබැඳි අගය, මූල්‍ය කළමනාකරණයේ

(39) (අ) දුක්ගන්නාරාළ, ඔම්බුඩ්ස්මන් / කාර්මික ආරවුල් (ආ) සංවර්ධනය , පුහුණුව

(40) (අ) අලෙවිකරණ සැලැස්ම, මෙහෙයුම් සැලැස්ම (ආ) සංවිධාන සටහන, සාර්ව විශ්ලේෂණය

(41) (1) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත (2) 2007 අංක 07 දරණ සමාගම් පනත
(3) 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනත (4) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත.

(42) (1) ස්වයං ඇගයීම (2) පුහුණුව
(3) අධ්‍යාපනය (4) අත්දැකීම් වලින් ඵල ලැබීම.

(43) (1) සඵලදායී (2) සඵලදායී නොවේ.
(3) සඵලදායී නොවේ. (4) සඵලදායී

(44) (1) ගබඩා පිරිවැය අඩු වීම. (2) සමස්ථ ලාභදායීත්වය වැඩි වීම.
(3) සැපයුම් දාමය කාර්යක්ෂම වීම. (4) කාරක ප්‍රාග්ධන ගැටළු ඇති වීම අවම වීම.

(45) (1) මිල (2) ගුණත්වය
(3) සැපයිය හැකි වේගය (4) භාණ්ඩ වල පිරිවිතර
(5) විශ්වාසවන්ත බව (6) පොරොත්තු කාලය
(7) ගෙවීම් කොන්දේසි

(46) (1) මිල ප්‍රතිපත්තිය තීරණය කිරීම. (2) ඉල්ලුම නිශ්චය කිරීමට.
(3) පිරිවැය ඇස්තමේන්තු කිරීමට. (4) තරඟකරුවන්ගේ මිල ක්‍රියාකාරකම විමසීම.
(5) මිල ක්‍රමයක් තෝරා ගැනීම. (6) රජයේ නීති රීති සලකා බැලීමට.
(7) අවසාන මිල තීරණය

(47) (1) බලපත්‍රලාභී මුදල් සමාගම් (2) සමූපකාර ග්‍රාමීය බැංකු
(3) සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර බැංකු (සණස) (4) ක්ෂුද්‍ර මූල්‍ය ආයතන

(48) (1) එකඟ වූ අයිතිවාසිකම් හා වරප්‍රසාද ලැබෙන බව තහවුරු වීම.
(2) කම්කරු අයිතීන් ආරක්ෂා වීම.
(3) අණ පනත්වලින් හිමි වරප්‍රසාද ඉක්මවා යන ප්‍රතිලාභ ලබා ගත හැකි වීම.
(4) තම අයිතිවාසිකම් මෙන් ම වගකීම් ද පැහැදිලි කර ගැනීමට හැකි වීම.
(5) සේවක සුරක්ෂිතභාවය තහවුරු වීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

II පත්‍රය

(49) (1) මුල් පිටුව (2) විධායක සාරාංශය (3) ව්‍යාපාර විස්තරය
(4) අලෙවිකරණ සැලැස්ම (5) මෙහෙයුම් සැලැස්ම (6) මානව සම්පත් සැලැස්ම
(7) මූල්‍ය සැලැස්ම

(50) (1) Microsoft Windows (2) Microsoft Edge
(3) Microsoft Teams (4) Microsoft Outlook

01. (i) (අ) අවශ්‍යතාවය - ආහාර (ල. 01)
වුවමනාව - කාබනික එළවළු, පළතුරු
(ආ) භාණ්ඩ (ල. 01)
(ඇ) ආර්ථික පරිසරටය - විදේශ විනිමය හිඟතාවය මත ආනයන වියදම් ඉහළ යයි. ගෙන්වීම සීමාවී හා ඉහළ පිරිවැයක් මත ගෙන්වීම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් නිෂ්පාදිත මිල ගණන් ඉහළ යාමට හේතු වේ. (ල. 02)

(ii) එකඟ නොවේ. (ල. 1/2)
(අ) මෙම ආයතනය සම්බන්ධ සැපයුම්කරුවෙකුගේ අනිසි ක්‍රියාවක් මිස ආයතනය ආචාරධර්ම විරෝධීව හැසිරීම් සිදු නොකරයි. (ල. 1 1/2)
(ආ) ගුණාත්මක - නිෂ්පාදිත බිහිකිරීම ♦ අපද්‍රව්‍ය කළමනාකරණය
පරිසර දූෂණය අවම වීම මත ප්‍රජාවගේ සහයෝගීතාවය කැමැත්ත ඉහළ යාම. (ල. 02)

(iii) විද්‍යුත් වානිජ්‍යය (ල. 01)
වාසි - වෙළඳපල පුළුල් වීම. ♦ පිරිවැය වාසි / කාර්යක්‍ෂම සේවය නිසා කීර්ති නාමය ඉහළ යාම.(ල.1/2x3=11/2)
සීමා - තාක්ෂණික බාධා ♦ අන්තර්ජාල සම්බන්ධතා නොතිබීම ♦ භාණ්ඩ භෞතිකව පරීක්‍ෂා කළ නොහැකි වීම. (ල.1/2x3=11/2)

(iv) (අ) පරිසර ආරක්‍ෂණය වෙනුවෙන් - අපද්‍රව්‍ය කළමනාකරණය
සමාජ තිරසර බව වෙනුවෙන් - ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණ
ආර්ථික තිරසර බව වෙනුවෙන් - රැකියා නිර්මාණය, තාක්ෂණය භාවිතය
වැනි කරුණු 03 ක් ඔස්සේ පිළිතුර පැහැදිලි කිරීම. (ල. 03)
(ආ) හරිත පාලනය යනු පරිසර ආරක්‍ෂාව සහ සමාජ වගකීම සහිත ව්‍යාපාර කරගෙන යාම සඳහා ආර්ථික, සමාජීය සහ පරිසරය අතර සමතුලිතභාවයක් ඇති කිරීමේ අරමුණිනින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි. (මෙවැනි අදහසක් ඉදිරිපත් කරන පිළිතුරකට) (ල. 01)

(v) අවදානම යනු ලාභ ලැබීමට ඇති අවිනිශ්තභාවය හා අලාභ සිදුවීමට ඇති හැකියාවයි. (ල. 02)
- නිෂ්පාදන තාක්ෂණය වෙනස් වීම. - සැපයුම්කරුවන්ගේ ගැටළු
- උපකරණ හිඟය (ල. 1x2 =2)

02. (i) (අ) කිසියම් ව්‍යාපෘතියක් කරගෙන යාම සඳහා රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය අතර ඇතිකරගන්නා දිගු කාලීන එකඟතාවයකි. බොහෝ විට අරමුණ වන්නේ පොදු ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමයි. (මෙහිදී බොහෝ විට රජය සතු බලතල, පෞද්ගලික අංශය සතු කාර්යක්ෂමතාවය, ප්‍රාග්ධනය එක් වේ.) (ල. 02)
(ආ) යටිතල පහසුකම් වේගයෙන් වර්ධනය වීම. ♦ විදේශ විනිමය ගලා ඒම ♦ නව තාක්ෂණික, කළමනාකරණ දැනුම මත ශ්‍රම බලකාය ඵලදායී වීම. ♦ රැකියා උත්පාදනය ♦ රාජ්‍ය වැය බර අඩුවීම. (ල. 02)

(ii) (අ) ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම. ♦ මූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී පහසුවක් වීම ♦ පාරිභෝගික විශ්වාසය ඉහළ යාම. ♦ රාජ්‍ය සහන ලබා ගැනීමේදී පහසුවක් වීම. (ල. 1x2 =2)
(ආ) අයදුම්පත්‍රය. ♦ ග්‍රාම නිලධාරි සහතිකය ♦ ජාතික හැඳුනුම්පතේ පිටපතක් ♦ ව්‍යාපාර ස්ථානය පිහිටීම සනාථ කිරීමට ඔප්පුවේ පිටපතක් හෝ බදු ඔප්පුවේ පිටපතක්. (ල. 1/2x4 =2)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(iii) (අ) හවුල් ව්‍යාපාර - සුදුසු නමක්.

සී/ස පෞද්ගලික සමාගම් - සී / ස .... (පෞද්ගලික) සමාගමකි. (ල. 1/2x4 =2)

(ආ) ප්‍රාග්ධනය සීමා වීම. ♦ වගකීම අසීමිත වීම. ♦ නෛතික පුද්ගලභාවයක් නොමැති වීම. ♦ අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම ♦ කළමනාකරණ කටයුතු අපහසු වීම. (ල. 02)

(iv) (අ) ඒකාබද්ධ හෝ අත්පත් කර ගැනීම සිදුවන ව්‍යාපාර වල ශක්තීන් තනි ව්‍යාපාරයකට සම්බන්ධ වීම.

♦ මූල්‍ය ශක්තිය වැඩි වීම. ♦ ව්‍යාපාර දාමය ශක්තිමත් වීම. ♦ කළමනාකරණය පහසු වීම. (ල. 02)

(ආ) සුදුසු නිදසුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 02)

(v) (අ) ♦ පිරිවැය අඩු වීම - භාණ්ඩ මිල පහළ යාම.

♦ සේවාවේ ගුණාත්මකභාවය ඉහළ යාම.

♦ පෞද්ගලික ආයතන සමඟ තරඟකාරීව විකල්ප රැසක් භාවිතයට ලැබීම.

♦ කාර්යක්ෂමතාව වැඩි වීම. (ල. 1/2 =2)

(ආ) ♦ පෞද්ගලික අංශය විසින් අහිතකර ලෙස ලාභ ඉපයීම වැනි වෙළෙඳපොළ තත්ත්ව පාලනය කිරීම.

♦ ඒකාධිකාරී ආයතන බිහි වීම වැළැක්වීම.

♦ ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වා ගෙන යාමට.

♦ සාධාරණ මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට

♦ පෞද්ගලික අංශය අත නොගසන මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම සිදු කිරීමට. (ල. 1/2x4 =2)

03. (i) (අ) රටක මූල්‍ය අධිකාරිය / මහ බැංකුව විසින් නිකුත් කරන මුදල් ය. උදා :- කාසි හා නෝට්ටු

1) සීමා සහිත ව්‍යවහාර මුදල්

2) සීමා රහිත ව්‍යවහාර මුදල් (ල. 02)

(ආ)

සීමාසහිත ව්‍යවහාර මුදල්	සීමාරහිත ව්‍යවහාර මුදල්
♦ නියමිත ප්‍රමාණයක් දක්වා පමණක් ගෙවීම් කළ හැකිය.	♦ ඕනෑම ප්‍රමාණයක ගෙවීම් සඳහා යොදා ගත හැකිය.
♦ සියලු කාසි වර්ග මීට අයත් වේ.	♦ මුදල් නෝට්ටු වර්ග මීට අයත් වේ.
♦ කුඩා ගෙවීම් සඳහා යොදා ගත හැකිය.	♦ විශාල ගෙවීම් සඳහා යොදා ගත හැකිය.

(ල. 02)

(ii) (අ)

	ජංගම ගිණුම	ඉතිරි කිරීමේ ගිණුම
1)	චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකිය.	♦ නොහැකිය.
2)	ශේෂය මත පොළියක් හිමි නොවේ.	♦ හිමිය.
3)	අයිරා පහසුකම් ලැබේ.	♦ නැත.
4)	ප්‍රධාන අරමුණු ගනුදෙනු කිරීමය.	♦ ඉතිරි කිරීම.
5)	ආරම්භ කිරීමේදී චෙක්පතක් හිමි වේ.	♦ පාස් පොතක් හිමි වේ.

(ල. 02)

(ආ)

	රේඛිත චෙක්පත	රේඛණය නොකළ චෙත්පත
1)	චෙක්පත මතුපිට සරල සමාන්තර රේඛා 02 ක් හෝ බැංකුවක නමක් සඳහන් වේ.	♦ එලෙස නැත.
2)	බැංකු ගිණුමක තැන්පත් කිරීමකින් පමණක් මුදල් ලබාගත හැකිය.	♦ බැංකු කවුන්ටරයෙන් වුවද මුදල් ලබා ගත හැකිය.
3)	වැඩි ආරක්ෂාවක් ඇත.	♦ ආරක්ෂාව අඩුය.

(කරුණු 02 කට ල. 02)

(iii) (අ) 1) ආදායකයාගේ ගිණුමට පමණි යන්න රේඛණය කිරීමෙන්

2) චෙක්පත පිටුපස සීමාකාරී පිටසනක් යෙදීමෙන්

උදා:- සමන් කුමාරට පමණක් ගෙවන්න. - කමල් දේශප්‍රිය. (ල. 02)

(ආ) <u>ප්‍රධාන අරමුණු</u> - දේශීය මිල ස්ථායිතාව අත්කර ගැනීම හා පවත්වාගෙන යාම. (ල. 01)

<u>අනෙක් අරමුණු</u> - මූල්‍ය සුරක්ෂිතතාව පවත්වාගෙන යාම. (ල. 01)

(iv) (අ) 1) පවාරණ අගය ලබා ගැනීම.

2) ගෙවා නිමි ඔප්පුවක් බවට පත් කර ගැනීම. (ල. 02)

(ආ)	ජීවිත රක්ෂණ	දේපල රක්ෂණ
1)	හානිපූර්ණය හා එහි උපමූලධර්ම අදාළ නොවේ.	♦ අදාළ වේ.
2)	පොළී, ප්‍රසාද දීමනා වැනි ප්‍රතිලාභ හිමි වේ.	♦ හිමි නොවේ.
3)	ඉතිරි කිරීමකට සමානය	♦ නැත
4)	දිගු කාලීන ය.	♦ වාර්ෂිකව ලබාගත යුතුය.
5)	රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකිය.	♦ පැවැරිය හැකිය.
6)	රක්ෂණ ඔප්පුව ඇප තැන්පතුවක් ලෙස පිළිගනී.	♦ ඇප තැන්පතුවක් ලෙස පිළි නොගනී.

(ල. 02)

(v) යවන්නා - විදුහල්පති

පණිවිඩය - විදුහල්පති තුමා ඉදිරිපත් කළ අදහස

ආකේතනය - සිතට නැගුන අදහස වචන බවට පත් කිරීම.

මධ්‍ය - වාචික

විකේතනය - කථාවට සවන් දී එය තේරුම් ගැනීම.

ප්‍රතිචාරය - විදුහල්පතිතුමාගේ කථාවට ළමුන් සහ ගුරුවරුන් දක්වන ප්‍රතිචාර (ල. 04)

04\. (i) (අ) ගබඩාකරණය යනු තොගයක් මිලදී ගත් අවස්ථාවේ හෝ නිෂ්පාදනය කළ අවස්ථාවේ සිට ඒවා අලෙවි කරන තෙක් හෝ භාවිතයට ගන්නා තෙක් හෝ බෙදාහරින තෙක් හෝ කල්තබා ගැනීමේ හෝ රැස්කර තබාගැනීමේ ක්‍රියාවලියයි. (ල. 02)

(ආ) 1. තොග ලැබීම. 2. තොග හඳුනාගැනීම.
3. තොක පරීක්ෂා කිරීම 4. නිවැරදි බව තහවුරු කර ගැනීම.
5. ගුණාත්වය තහවුරු කර ගැනීම. 6. ඉවතින් තැබීම.
7. නිකුත් කිරීම සඳහා නැවත ලබාගැනීම. (ල. 02)

(ii) (අ) ප්‍රවාහන හා සැපයුම් සේවා යනු පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම තහවුරු කිරීමේ අරමුණින් භාණ්ඩ සේවා හා අදාළ තොරතුරු ඉදිරියට හා පසුපසට ගලායාම ඒවායේ ආරම්භක අවස්ථාවේ සිට පාරිභෝජණ අවස්ථාව දක්වා කාර්යක්ෂමව හා සඵලදායීව සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි. (ල. 02)

(ආ) සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති - අමුද්‍රව්‍ය ආයතනය දක්වා ප්‍රවාහනය හා නිෂ්පාදනයෙන් පසු අඛණ්ඩව නිෂ්පාදිත පාරිභෝගිකයා දක්වා ප්‍රවාහනය සමබර වූ පද්ධතියක් නිසා. (ල. 02)

(iii) තොග වෙළෙඳාම - අමුද්‍රව්‍ය මිලදී ගැනීම.

සිල්ලර වෙළෙඳාම - ප්‍රදාර්ශනාගාර හරහා නිමි ඇඳුම් අලෙවිය.

ආනයන වෙළෙඳාම - අමුද්‍රව්‍ය විදේශ රටවලින් ගෙන්වීම.

අපනයන වෙළෙඳාම - නිමි ඇඳුම් විදේශ රටවලට යැවීම. (ල. 04)

(iv) ඉන්ඩෙන්ටුව ♦ නෞභාර පත ♦ ඉන්වොයිසිය ♦ ණයවර ලිපිය ♦ ආනයන සටහන්තරය ♦ ප්‍රභවස්ථාන සහතිකය ♦ රක්ෂණ සහතිකය (ල. 04)

(v) (අ) නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිලදී ගැනීම. (ප්‍රධාන ලක්ෂණය) ♦ භාණ්ඩ තොග වශයෙන් අලෙවි කිරීම. ♦ වෙළෙඳ වට්ටම් ලබාදීම. ♦ භාණ්ඩ තොග වශයෙන් ප්‍රවාහනය කිරීම. ♦ අලෙවි ප්‍රවර්ධන කටයුතු ♦ වෙළෙඳපොළ පිළිබඳ පර්යේෂණ සිදු කිරීම. ♦ තොග ප්‍රවාහනය කර දීම. (ල. 02)

(ආ) නිෂ්පාදකයාට - නිෂ්පාදකයාගේ නිෂ්පාදන තොග වශයෙන් ලබා ගැනීම.

වෙළෙඳපොල පිළිබඳ තොරතුරු ලබා දීම.

නිෂ්පාදකයාට විවිධ සේවාවන් ලබාදීම. (ල. 02)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

05. (i) (අ) ♦ පැහැදිලි පරමාර්ථ හා අරමුණු පදනම් වීම. ♦ නිශ්චිත කාල සීමාවක් සඳහා සීමා වීම. ♦ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකි වීම. ♦ නම්‍යශීලී වීම. ♦ සෑම මට්ටමකම සේවකයින්ට තේරුම් ගත හැකි වීම. ♦ සෙසු කළමනාකරණ කාර්යයන්ට පෙර හා ඊට සම්බන්ධ වන ආකාරයට සැකසීම. ♦ පිරිවැය අභිබවා ප්‍රතිලාභ ලැබිය හැකි වීම. (ල. 02)

(ආ) පාලනයේ දී සිදුවන්නේ සැලසුම්කළ ආකාරයටම කාර්යයන් සිදුවනවා ද නැද්ද යන්න සොයා බලා එසේ නොවන අවස්ථාවල අවශ්‍ය ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීමයි. එබැවින් පැලනයේදී සැලැස්ම අනුව සසඳා බැලීමට සැලසුමක් තිබීම අත්‍යවශ්‍ය වේ. සැලැස්මක් නොමැති ව පාලනයක් සාර්ථකව සිදු කළ නොහැකි වේ. (ල. 02)

(ii) (අ) ව්‍යවසායකයා - නව ව්‍යාපෘති හඳුන්වා දීම.

සම්පත් වෙන්කර දෙන්නා - කළමනාකරුවන්ට හා සේවකයින්ට තම කාලය ලබා දීම. (ල. 1/2 x 4 = 2)

(ආ) පවත්වා නිෂ්පාදිත පිළිබඳවත්, නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳවත් නව නිෂ්පාදන සැලසුම් පිළිබඳවත් තොරතුරු ඒකරාශි කිරීම හා ඒවා වැඩි දියුණු කිරීම පර්යේෂණ හා සංවර්ධනය ලෙස හැඳින්වේ.

- ♦ නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීමට හැකි වීම.
- ♦ පිරිවැය අවම ක්‍රම හඳුන්වා දීමට හැකි වීම.
- ♦ නවෝත්පාදන බිහි වීම.
- ♦ භාණ්ඩ නවීකරණය වීම.
- ♦ තරඟයට මුහුණ දීමට හැකි වීම. (ල. 02)

(iii) (අ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය (ල. 02)

(ආ) (i) ඉදිරි පෝෂණ පාලනය / වැළැක්වීම. (ii) ක්‍රියාවලි පාලනය / සමගාමී

(iii) පසු පෝෂණ පාලනය / නිවැරදි කිරීම (ල. 1x3=3)

(iv)

යෙදවුම්		පරිවර්තන ක්‍රියාවලිය		නිෂ්පාදිතය
♦ භූමිය - ඉඩම, හිරුඑළිය, වාතය ♦ ශ්‍රමය - කළමනාකරුවන් සේවකයින් ♦ ප්‍රාග්ධනය - ගොඩනැගිලි යන්ත්‍ර සූත්‍ර මෝටර් රථ ♦ ව්‍යවසායකත්වය - සාධක සංයෝග කරන්නන්ගේ හැකියාව	→	♦ නිෂ්පාදන ක්‍රියාපටිපාටි අනුගමන කිරීම - පලතුරු රැස්කර පිරිසිදු කිරීම. - පලතුරු වියලීම. - බෝතල් කිරීම. ♦ නිෂ්පාදන ක්‍රම තීරණය කිරීම - කාර්ය, කාණ්ඩ ප්‍රවාහ ක්‍රම වලින් සුදුසු ක්‍රමය තෝරා ගැනීම. ♦ අවශ්‍ය ප්‍රමාණයට සම්පත් යෙදවීම. - මුදල්, යන්ත්‍ර සූත්‍ර, ශ්‍රමය සහ අනෙකුත් සම්පත් ♦ තාක්ෂණික දැනුම යොදා ගැනීම. - නවීන තාක්ෂණික ක්‍රම නිෂ්පාදන හා ඇසුරුම් කාර්යයන්ට යොදා ගැනීම.	→	වියළන ලද බෝතල් කළ පලතුරු (ල. 4)

(v) (අ) ♦ තත්ත්ව කව ♦ ශුන්‍ය දෝෂ ♦ තත්ත්ව ආරක්ෂණය ♦ ගුණත්ව ප්‍රමිති ♦ සංඛ්‍යානාමය ක්‍රියාවලි පාලනය (ල. 1/2x4=2)

(ආ) ♦ පුහුණු සේවකයින් යොදා ගැනීම. ♦ සේවකයින් පුහුණු කිරීම. ♦ තත්ත්ව කව යොදා ගැනීම.

♦ මූල්‍යමය හා මූල්‍යමය නොවන දිරිගැන්වීම් ලබා දීම. ♦ යහපත් කාර්මික සබඳතා පවත්වා ගැනීම. (ල. 1x2=2)

06. (i) (a) ඒකක 2000 (a) ඒකක 650

(c) ඒකක 6200 (ල. 04)

(ii) (අ) විෂම ගති ලක්ෂණ වලින් යුක්ත සමස්ථ වෙළෙඳපොළ සමාන ගති ලක්ෂණ වලින් යුත් කණ්ඩායම් වලට බෙදාවෙන් කිරීමයි. (ල. 02)

(ආ) 1) පාරිභෝගික විසඳුම 2) පිරිවැය

3) පහසුව 4) සන්නිවේදනය (උදාහරණ මේ ඉදියෙන් ලියන්න.) (ල. 02)

(iii) (අ) 1) සංවර්ධන අදියර 2) හඳුන්වා දීමේ අදියර

3) වර්ධන අදියර 4) පරිණත අදියර

5) පිරිහීමේ අදියර උදාහරණ (ල. 02)

(ආ) 1) පර්යේෂණ කටයුතු වැඩිපුර කිරීම. 2) ප්‍රවර්ධන කටයුතු වැඩිපුර කිරීම.

3) නිෂ්පාදිත ගුණත්වය වැඩි කිරීම. 4) නිෂ්පාදිත විවිධාංගීකරණයට ලක් කිරීම.

5) පිරිවැය කපා හැරීම හෝ නිෂ්පාදිතය නවතා දැමීම / විකිණීම. (ල. 02)

(iv) භාණ්ඩ හා සේවා ඉක්මනින් මිලදී ගැනීමට හෝ වැඩි වශයෙන් මිල දීගැනීමට පාරිභෝගිකයින් වෙළෙඳුන් හා විකුණුම් සේවකයන් පොළඹවා ගැනීමේ ක්‍රියාවලියයි.

1) පාරිභෝගික ප්‍රවර්ධනය උදා:- මිල අඩු කිරීම / සාම්පල් ලබාදීම / වගකීම් ලබා දීම.

2) වෙළෙඳ ප්‍රවර්ධනය උදා:- ♦ නොමිලේ භාණ්ඩ ප්‍රචාරණය කර දීම. ♦ ප්‍රවර්ධන දීමනා ලබාදීම. ♦ ත්‍යාග ලබාදීම.

3) විකුණුම් සේවක ප්‍රවර්ධනය උදා:- ♦ සේවකයින් සඳහා තරඟ සංවිධානය කිරීම. ♦ නොමිලේ නිල ඇඳුම් ලබාදීම. ♦ ප්‍රචාරණ වැඩ සටහන් වලට සේවකයින් යොදවා ගැනීම. (ල. 04)

(v) (අ) ආයතනයේ කටයුතු වලට අවශ්‍ය අරමුදල් සැලසුම් කිරීම, එම අවශ්‍යතාවලට සරිලන අරමුදල් සම්පාදනය හා ඒවා කාර්යක්ෂම ලෙස හා ඵලදායිව භාවිතා කිරීම. (ල. 02)

(ආ) යම් ආර්ථික මූල්‍ය තීරණ ක්‍රියාත්මක කරන මූල්‍ය වෙළෙඳපොළ, මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ, මූල්‍ය යටිතල පහසුකම්, මධ්‍යම බැංකුව යනාදියෙන් සමන්විත වන පද්ධතියකි. (ල. 02)

07. (i) (අ) අරමුදල් සපයන්නන් හා අරමුදල් ඉල්ලුම් කරන්නන් සම්බන්ධ කෙරෙන ස්ථානයක් හෝ අවකාශයකි. (ල. 02)

(ආ) 1) මුදල් වෙළෙඳපොළ - කෙටි කාලීන මූල්‍ය වත්කම් විකිණීම හා මිලට ගැනීම සිදුවන වෙළෙඳ පොළය.

2) ප්‍රාග්ධන වෙළෙඳපොළ - වසරකට වඩා වැඩි කාලයක් තුළ කල් පිරෙන මූල්‍ය උපකරණ ගනුදෙනු වන වෙළෙඳපොළ. (ල. 02)

(ii) මූල්‍ය උපකරණ

1) සාමාන්‍ය කොටස් 2) වරණීය කොටස්

3) කොටස් බලපත්‍ර 4) සාංගමික ණයකර

5) රජයේ සුරැකුම්පත් 6) වාණිජ පත්‍රිකා

සෘජු ප්‍රතිලාභ

1) ලාභාංශ 2) පොළී

3) සංචිත ප්‍රාග්ධනීකරණය 4) හිමිකම් නිකුතුව

5) ප්‍රාග්ධන ලාභ (ල. 04)

(iii) (අ) රැකියාව හෝ රැකියා පරිසරය සම්බන්ධයෙන් සේවකයෙකු හෝ සේවක කණ්ඩායමක ඇතිවන මානසික කලකිරීමකි. (ල. 02)

(ආ) රැකියාව ආශ්‍රිත හේතුවකි.
එනම්:- පුහුණුවීම් යාවත්කාලීන නොවීම. / දැනුමට කුසලතාවයට නොගැලපෙන රාජකාරි පැවරීම.(ල. 02)

(iv) (අ) $\frac{100}{550} \times 100 = 18\%$ (ල. 02)

(ආ) ♦ නිෂ්පාදන කටයුතු අඩාල වීම. ♦ නව සේවක බඳවාගැනීම් පිරිවැය ඉහළ යාම. ♦ ගනුදෙනුකරුවන් අහිමි වීම. ♦ පුහුණු අවශ්‍යතා ඉහළ යාම හා පිරිවැය ♦ කීර්තිනාමයට හානි සිදුවීම. (ල. 02)

(v) (අ) පුහුණුව හා සංවර්ධනයෙන් සේවායෝජකයාට අත්වන ප්‍රතිලාභ

♦ සේවක දැනුම, කුසලතා හා ආකල්ප යාවත්කාලීන වීම. ♦ සේවක කාර්ය සාධනය වර්ධනය වීම.
♦ නිමැවුමේ ගුණාත්මකභාවය ඉහළ යාම. ♦ සේවක අභිප්‍රේරණය ඇති වීම. ♦ සේවක පක්ෂපාතීත්වය ඉහළ යාම. ♦ සේවකයන් අතින් ඇතිවන වැරදි හා නාස්තිය අඩු වීම. ♦ සේවක ප්‍රවාසිතාව අඩු වීම.
♦ සේවක පිරිවැටුම අඩු වීම. (කරුණු 4 කට ල. 02)

(ආ) පුහුණුව හා සංවර්ධනයෙන් සේවකයාට අත්වන ප්‍රතිලාභ

♦ රැකියා තෘප්තිය වැඩි වීම. ♦ කාර්ය සාධනය ඉහළ යාම නිසා ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ (වැටුප් වැඩි වීම.)
♦ උසස්වීම් ලැබෙන ඉඩකඩ පුළුල් වීම. ♦ සේවක දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වීමෙන් සේවක වටිනාකම ඉහළ යාම. ♦ නව අත්හදා බැලීම් සිදු කිරීමට අවකාශ ලැබීම. ♦ අතිරේඛ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වීම. (ශිෂ්‍යත්ව, විදේශ සංචාර ආදිය..) (කරුණු 4 කට ල. 02)

08. (i) (අ) 1. දෘඩාංග (Hardware) 2. මෘදුකාංග (Software)
3. ජීවාංග (Live ware) 4. දත්ත (Data)
5. ක්‍රියාපටිපාටි (Procedures) 6. ස්ථිරාංග (Firmware) (කරුණු 4 කට ල. 02)

(ආ) මෙහෙයුම් කළමනාකරණ තොරතුරු පද්ධතියක කාර්යයන්

♦ ද්‍රව්‍ය මිලදී ගැනුම් සැලසුම් කිරීම හා පාලනය ♦ පරිගණක සමෝධානික නිෂ්පාදනය
♦ යන්ත්‍රෝපකරණ පාලනය ♦ නිෂ්පාදන ක්‍රියාවලියක් සැලසුම් කිරීම. (ල. 1/2 x 2 = 01)

අලෙවිකරණ තොරතුරු පද්ධතියක කාර්යයන්.

♦ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ♦ නව නිෂ්පාදන වෙළෙඳපොලට හඳුන්වා දීම.
♦ වෙළෙඳපොළ පර්යේෂණ ♦ විකුණුම් පුරෝකථන සිදු කිරීම. ♦ විකුණුම් ප්‍රවර්ධන කටයුතු
(ල. 1/2 x 2 = 01)

(ii) (අ) ව්‍යාපාරයක සිටින කළමණාකරුවන්ට විවිධ තීරණ ගැනීම සඳහා තොරතුරු පද්ධති බෙහෙවින් උපකාරී වේ. නමුත් තොරතුරු පද්ධති ව්‍යාපාරයකට අවශ්‍ය වන්නේ තීරණ ගැනීමට පමණක්ම නොවේ. මීට අමතරව ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම, එදිනෙදා සිදුකරන කාර්යයන් සාර්ථකව හා නිවැරදිව ඉටුකර ගැනීම, සම්පත් නාස්තිය අවම කර ගැනීම, ව්‍යාපාරයේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීම යනාදී අවශ්‍යතා සඳහා ද තොරතුරු පද්ධති ව්‍යාපාරයකට අතිශය වැදගත් වේ.(ල. 02)

(ආ) සංවිධානයක අග්‍ර කළමනාකරුවන්ට ව්‍යාපාරයේ අභ්‍යන්තර මෙන් ම බාහිර ගැටලු විසඳීම සඳහා ද උපක්‍රමික තීරණ ගැනීමට උපකාරී වන තොරතුරු පද්ධති වේ.
නිද :- සභාපති, සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩලය.
මෙම මට්ටමේ කළමනාකරුවන් විසින් ආයතනයේ ඉදිරි ගමන් මග තීරණය කෙරෙන, සමස්ත ආයතනයට ම බලපාන හා දිගු කාලීන තීරණ ගනු ලැබේ. ඒ සඳහා ආයතනයේ අභ්‍යන්තර මෙන් ම බාහිර තොරතුරු ද අවශ්‍ය වේ. බොහෝ විට ඔවුන්ට අවශ්‍ය තොරතුරු සාරාංශ ගත ව ලබා දිය යුතුය. (ල. 02)

(iii)

08



(සම්පූර්ණ නිවැරදි ගැලීම් සටහනට ල. 04)

(iv) (අ) • පැහැදිලි ඉම • ගනුදෙනුකරුවෝ • ඉලක්ක • අවශ්‍ය මූල්‍ය සම්පත්(කරුණු 04 ට ල. 02)

(ආ) • පවත්නා තරගකාරීත්වය • තරගකරුවෝ හා ඔවුන්ගේ ශක්ති • තරගකාරීත්වයට මුහුණ දීමට තමා සතු ශක්ති හා දුර්වලතා • වෙළෙඳ පොළට පිවිසීමට ඇති බාධා, එනම් පිරිවැය කාලය, තාක්ෂණය, පේටන්ට් බලපත්‍ර හා වෙළෙඳ ලකුණ ආදිය (කරුණු 04 ට ල. 02)

(v) (අ) ව්‍යාපාරය කුමක්ද යන්න හා ව්‍යාපාරය සපයනු ලබන භාණ්ඩය හෝ සේවාව හෝ පිළිබඳ විස්තරත් එමගින් ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභත්, එහි සුවිශේෂත්වය විස්තර කෙරෙන කොටස යි. (ල. 02)

(ආ) • ව්‍යාපාරයේ නම හා ලිපිනය • ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ • ආදි කර්තෘවරු • සංවිධාන ව්‍යුහය • අධ්‍යක්ෂ මණ්ඩලය • භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර. (කරුණු 04 ට ල. 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources